ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

පරිපාලන නීතිය - **LWU 3311/4331**

කාලය - පැය තුනයි (03).

---

දිනය - 2006.04.27 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.*

01. "නීත්‍යානුකූල අපේක්ෂාවෙහි පැවැත්ම තුළ විවිධ ප්‍රතිඵල ගණනාවක් පැවතිය හැක. එමඟින් අධිකරණ විමර්ශනය සඳහා ඉල්ලුම් කිරීමට නෛතික ස්ථිතිය ලබා දෙනු ඇත; යම් අධිකාරියකට එකී අපේක්ෂාවන් පරාජය වන ආකාරයෙන් ක්‍රියාකිරීමට තරම් මහජන ප්‍රතිපත්තියක් මගින් බලය ඉක්මවා ක්‍රියා කිරීම සාධාරණීකරණය කිරීමට යම්හේතුවක් ලබාදෙන්නේ නම් මිස එවැනි අධිකාරියක් එවැනි අපේක්ෂාවන් පරාජය වන ආකාරයෙන් ක්‍රියා නොකළ යුතු බවද ඉන් අදහස් වේ; එසේත් නැතිනම් නීත්‍යානුකූල අපේක්ෂාව පරාජය කිරීමට අධිකාරිය යෝජනා කරයි නම් එවිට යමෙකුට එම කරුණ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ප්‍රදානය කරන බව ද ඉන් අදහස් විය හැක."

Halsbury, Halsbury's Laws of England, 4th Edition, Vol.(1), p 151

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

02. මාස 02 කට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා නිර්ණායකයන් ප්‍රසිද්ධියට පත් කළේය. නාලිනී කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සඳහා අයදුම් කළා ය. ඇය ප්‍රවේශ රෙගුලාසි වල සඳහන් වූ සියළුම අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළාය. අවසන් දිනයෙන් සති 2 කට පසුව ඇගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරමින් පිළිතුරක් ලැබිණි. එම ලිපිය තුළ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට කිසිදු හේතුවක් සඳහන් නොවීය. අධිකාරියේ තීරණයට පදනම් වූ හේතු නොදැක්වීම මත එම තීරණයට විරුද්ධව ඇයට ප්‍රබල නඩුකරයක් සතුවන බව නාලිනී විශ්වාස කරයි.

තම අයදුම්පත නැවත සළකා බලන මෙන් ඉල්ලා ඇය අභියාචනයක් ගොනු කළා ය. එළැඹෙන සතියේ දී ඇයගේ පැමිණිල්ල වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන මෙන් අභියාචන මණ්ඩලය ඇයට දන්වා සිටියේය. තමාවෙනුවෙන් නීතිඥයෙකු ගේ සහාය ලබා ගැනීමට ඇය ඉල්ලා සිටිය මුත් අභියාචනා මණ්ඩලය එය ප්‍රතික්ෂේප කළේය. ඇයගේ නඩුකරය විභාග වෙමින්

පැවතිය දී ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළ ප්‍රධාන නිලධාරියා අභියාචන මණ්ඩලයේ සභාපති අසලින් අසුන්ගෙන සිටියේ ය.

අභියාචනය අවසානයේදී අභියාචන මණ්ඩලය කලින් දී තිබූ තීන්දුවම නැවත ස්ථිර කරනු ලැබීය. අභියාචන මණ්ඩලයේ තීන්දුව මගින් ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු ලැයිස්තුවක් දක්වා ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාවේ තීරණය ස්වභාවික යුක්ති මූලධර්ම කඩ කිරීම මත අභියෝග කිරීමට නාලිනී බලාපොරොත්තු වෙයි.

ස්වභාවික යුක්ති මූලධර්මයන්හි වර්තමාන වර්ධනයන් අදාළ කර ගනිමින් නාලිනීට උපදෙස් දෙන්න.

03. පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට නිර්දේශිත ව්‍යාපෘතීන් හි නම් ප්‍රසිද්ධියට පත් කිරීමේ බලය පරිසර අමාත්‍යවරිය සතු වේ. මෙම තීරණයට බලපාන කරුණු සළකා බැලීම පිණිස අමාත්‍යවරිය කමිටුවක් පත් කළාය. ඇය කමිටුවේ නිර්දේශ මත රජයේ ගැසට් නිවේදනයේ නිර්දේශිත ව්‍යාපෘතීන් ප්‍රසිද්ධියට පත් කරනු ලැබුවා ය. අමාත්‍යවරියට බලය දෙනු ලබන රෙගුලාසිවල එක් විධිවිධානයක් ප්‍රකාරව "අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක බවත්, එය කිසිදු අධිකරණයකදී ප්‍රශ්න කළ නොහැකි." බවත් සඳහන් වේ.

කුඩා පරිමාණයේ තීන්ත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් අර්ජුන සතුවේ. පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු නිර්දේශිත ව්‍යාපෘතියක් ලෙස මෙම කර්මාන්තය ගැසට් නිවේදනයේ අන්තර්ගත වේ. පසුගිය ගැසට් නිවේදනයට අනුව මෙම කර්මාන්තය නිර්දේශිත ව්‍යාපෘති ලැයිස්තුවේ සඳහන් කර නොතිබුණි.

අමාත්‍ය බලතල කමිටුවට අභිනියෝජනය කිරීමට ඇමතිවරියට බලයක් නැති බව දක්වමින් අර්ජුන අමාත්‍යවරියගේ තීරණය අභියෝගයට ලක් කළේය. අමාත්‍යවරිය පාලනය වන හරයාත්මක රීතීන්ට එරෙහිව ක්‍රියා කර ඇති බව ඔහු තර්ක කළේය. එම කමිටුවේ එක් සාමාජිකයෙකු තමාගේ දේශපාලන ප්‍රතිවාදියකු වන බැවින් ඔහු තමා සමග අමනාපයෙන් පසුවන බවද අර්ජුන තවදුරටත් සඳහන් කරයි.

බලාතික්‍රමණ රීතිය යටතේ අමාත්‍යවරියගේ තීරණය අභියෝගයට ලක් කළ හැකි ද? එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව යන නෛතික පද්ධතීන් සැළකිල්ලට ගනිමින් අර්ජුන සතුව වලංගු තර්කයක් පවතින්නේ දැයි ඔබ සිතන්නේ ද?

සාකච්ඡා කරන්න.

04. *එක්කෝ*

*සිල්වා එ. ඉද්දමල්ගොඩ (Sc 471/2000,SCM 8.8.2003)* තීරණය ආධාර කර ගනිමින් නෛතික ස්ථිතිය පිළිබඳව ශ්‍රී ලංකා අධිකරණ ප්‍රවේශය පැහැදිලි කරන්න. මෙම විෂය ක්ෂේත්‍රයෙහි වර්ධනයන් ලෝකයේ වෙනත් නෛතික ක්‍රමයන් දෙකක් සමඟ සසඳමින් සාකච්ඡා කරන්න.

*නැත්නම්,*

ලේකම්වරයාගේ මතය අනුව "මහජන අධ්‍යාපන පහසුකම් සඳහා සමාන ප්‍රවේශයක්" යන්න ස්ථාපිත වන පරිද්දෙන් ඕනෑම පාසලකට ඇතුළත් වීම සම්බන්ධව නිර්ණායකය .. තීරණය කිරීමට පාසල් (ඇතුළත් කිරීමේ) පනතේ 1 වන වගන්තිය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය පවරා ඇත. නිර්ණායකයන් සම්බන්ධව කිසිදු පුද්ගලයකුට අභියාචන ඉදිරිපත් කිරීමට කිසිදු විධික්‍රමයක් හෝ තම තීරණයට හේතු දැක්වීමක් කළයුතු බවට හෝ පනත මඟින් ප්‍රතිපාදන සලසා නොමැත. තම තීරණය ගැනීමට පෙර ලේකම්වරයා ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා දෙමාපියන්ගෙන් අදහස් විමසීම කළ යුතුය.

2005 මැයි මස දී කොළඹ ජනප්‍රිය පාසලකට යොමු කළ අයදුම්පත් 50 ක් ලේකම්වරයා ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළේය. ලේකම්වරයා ප්‍රකාශ කරනුයේ එම අයදුම්කරුවන් ඔහු විසින් ප්‍රකාශිත ප්‍රවේශ නිර්ණායකයන් සම්පූර්ණ කර නොමැති බවයි. එම පාසලෙහි දැනටමත් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා සිසුන් අධ්‍යාපනය ලබන බැවින් මෙම අයදුම්කරුවන්ට ඇබෑර්තු නොමැති බව ඔහු තවදුරටත් ප්‍රකාශ කරයි. එක් එක් අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට පාදක වූ පැහැදිලි හේතූන් නොදක්වයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අධ්‍යාපන පර්යේෂණ සංගමය ඊට ප්‍රතිවිරුද්ධ ලෙස යෝජනා කර සිටින්නේ, අදාළ පාසලේ නිර්දේශිත ශිෂ්‍ය ප්‍රමාණයට වඩා අඩු මට්ටමක සිටින බවත් සම්පත් ප්‍රමාණය උපරිම මට්ටම ඉක්මවා පවතින බවත් ය. ඔහුගේ තීරණය ගැනීමට පෙර ලේකම්වරයා විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ දෙමාපියන්ගේ අදහස් විමසා නොමැත.

අමාත්‍යවරයාගේ තීරණය ප්‍රශ්න කිරීමට තමාට නෛතික ස්ථිතිය පවතී ද යන්න දැන ගැනීමට පහතින් දැක්වෙන සේවාදායකයෝ ඔබ හමු වෙති.

අ. නිදහස් අධ්‍යාපනය රැක ගැනීම සඳහා වර්ෂ ගණනාවක් ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටින මහජන විමුක්ති පක්ෂය,

ආ. තම නිවුන් දියණියන් දෙදෙනා පාසලට ඇතුළත් කර ගැනීමට එම ප්‍රදේශයෙන් මිල අධික නිවසක් මිලට ගත් පියදාස මොහොට්ටි.

මෙම තත්ත්වයන් යටතේ නෛතික ස්ථිතිය ලැබේද යන්න පිළිබඳව ඔබේ සේවාදායකයින්ට උපදෙස් දෙන්න.

05. පරිපාලන තීරණ විමර්ශනය කිරීම සඳහා රතු එළිය ප්‍රවේශය මඟින් අධිකරණයට ප්‍රබල පිටුවහලක් සපයයි. නීතියේ කාර්යය වන්නේ රජයේ අධිකතර බලය පාලනය කිරීම බව එය සඳහන් කරයි. කොළ එළිය ප්‍රවේශයට අනුව පරිපාලන නීතියේ කාර්යය වන්නේ රජයේ ක්‍රියාවන් සඳහා පහසුකම් සැලසීමයි.

සාකච්ඡා කරන්න.

06. පරිපාලන ක්‍රියාවන් අධිකරණ මගින් විමර්ශනය කිරීමේ මූලික පදනම, නීතියේ බලය සහ බලතල බෙදීම වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල මූලධර්ම මත ගොඩනැඟී ඇත.

ඔබ ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්නේ කෙසේ ද?

සාකච්ඡා කරන්න.

07. පසුගිය දශක කිහිපය තුළ නෛතික හා නෛතික නොවන ප්‍රතිකර්මයන් වෙත මහජන ප්‍රවේශය ශ්‍රී ලංකා සන්දර්භය තුළ වෙනස් වූවේ කෙසේ ද යන්න විවේචනාත්මකව අගයන්න.

08. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව අනුව පරිපාලන හා විධායක ක්‍රියා මූලික අයිතිවාසිකම් කඩවීම යන පදනම මත ප්‍රශ්න කළ හැක. පරිපාලන නීතිය යටතේ මහජන නිලධාරියෙකුගේ කාර්යය භාරය සහ මූලික අයිතිවාසිකම් යටතේ ඔවුන්ගේ කාර්යභාරය ඔබ වෙන්කර දක්වන්නේ කෙසේ ද ?

සාකච්ඡා කරන්න.

- හිමිකම් ඇවිරිණි. -